**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ඇත්කඳුර පුරනැගුම ගොඩනැගිල්ල පිහිටි භූමියේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම හා අම්පේගම ප්‍රජා ශාලාවට ජල ටැංකියක් හා මෝටරයක් ලබා ගැනීම වෙනුවෙන් වැය කරන ලද රු.227,404 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**(අ) ලැබිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.11,153,611 ක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.300,589 ක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉකුත් වර්ෂ වලදී නිමකර තිබුණු කර්මාන්ත 03 කට අදාළව ගෙවිය යුතු රු.444,108 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2015 සහ 2016 වර්ෂ වලට අදාළ මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීමේ දීමනා රු.66,100 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| රීති 131 | 2,522,602 | 2017 වර්ෂයේ සභාවට අයත් සාමාන්‍ය බැංකු ගිණුමක මාසික සාමාන්‍ය ශේෂය රු.2,522,602 ක් වුවද, ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,582,178 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,778,929 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 320,000 | 18,835 | 35,940 | 87,490 | 289,000 | 21,073 | 71,276 | 104,596 |
| (ii) | කුලී | 1,175,200 | 43,200 | 43,200 | - | 1,416,700 | 43,200 | 55,800 | 600 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 187,500 | 493,050 | 480,950 | 15,350 | 216,000 | 433,850 | 432,100 | 3,250 |
| | | 1,682,700 | 555,085 | 560,090 | 102,840 | 1,921,700 | 498,123 | 559,176 | 108,446 |

### 2.2.2 වරිපනම් හා බදු

බිල්කළ අක්කර බදු ආදායම රු.18,835 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ අයවීම් රු.35,940 ක් විය. සමාලෝචිත වර්ෂයට අදාළ මුදලින් අයවීම් සියයට 29 ක් තරම් අවම අගයක් විය.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුද්දර ගාස්තු රු.17,443,280 ක් හා උසාවි දඩ රු.138,417 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණ පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එය පැහැදිලි හා ක්‍රමවත් ලෙස පිළියෙල කර නොතිබුණි.

#### (ආ) ඉටු නොකළ කර්තව්‍යයන්

ගං වතුරින් හා නායයෑම් වලින් හානියට පත් වූ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා 2017 වර්ෂය තුළ මාර්ග අළුත්වැඩියාව වෙනුවෙන් රු.100,000 ක් හා මාර්ග සංවර්ධනය හා වීථි පහන් අළුත්වැඩියා වෙනුවෙන් රු.75,000 ක් ලැබී තිබුණ ද, 2018 ජුනි වනවිටත් එකී කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා දිවිතුර වතුයායේ පර්චස් 20 ක ඉඩම් කොටසක් යොදාගෙන තිබුණි. සතියකට වරක් ටොන් 0.25 ක් පමණ දිරන කසළ එම ඉඩමට බැහැර කරනු ලබන අතර, වලවල් කපා, වසා දැමීමේ සැලැස්මක් තිබුණ ද, එසේ කර නොතිබීම හේතුවෙන් කසළ ඉඩම පුරා විසිරී පැවැතුණි.

(ii) කසළ බැහැර කරන ඉඩම සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබූ අතර, 2017 වර්ෂය තුළ කසළ බැහැර කිරීම ගෘහස්ථ මට්ටමින් සිදුකිරීම සඳහා රු.47,782 ක් වැයකර, කසළ බඳුන් කට්ටල 13 ක් මිල දී ගෙන, බෙදාහැරීමකින් තොරව ගබඩාවේ තිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 චක්‍රලේඛය ප්‍රකාරව 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා සභා බලප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබීම හේතුවෙන් රු.780,160 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ සේවක සංයුතියේ ද්විතීයික අංශයේ තනතුරු 06 ක හා ප්‍රාථමික අංශයේ තනතුරු 02 ක පුරප්පාඩු හා එක් තනතුරක අතිරික්තයක් පැවැතුණි. එම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) පුස්තකාල සහායකයෙකුට කළමනාකරණ සහකාර තනතුරක වැඩ ආවරණය කිරීමට පවරා තිබූ අතර, වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකුට ආයුර්වේද ඖෂධ සංයෝජක හා පෙර පාසල් පාලිකා රාජකාරි පවරා තිබුණි.

**(ආ) සේවක ණය**

-------------

සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවකු ලෙස සේවය කල අයකු සේවය හැර යාම හේතුවෙන් සේවක ණය රු.150,206 ක් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පුරනැගුම බහු කාර්ය මධ්‍යස්ථානයේ පෙර පාසලක් ආරම්භ කිරීම සඳහා ළමා පුටු 40 ක් මිලදී ගෙන තිබූ නමුත්, පෙර පාසල ආරම්භ කර නොතිබීම නිසා ඉන් පුටු 32 ක් සභාවේ ගබඩාවේ රඳවා තිබුණි.

(ii) සභාව විසින් 2015 වර්ෂයේදි රු.430,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු DM 20 වර්ගයේ විදුලි ජනන යන්ත්‍රය මිලදී ගත් දින සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(iii) ශීතකරණයක් 2012 වර්ෂයේ සිට සභා ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

--------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයේ සිට බැහැර ගෙන ගොස්, භාරදිය යුතු කාලය ඉක්ම වූ රු.28,050 ක් වටිනා පුස්තකාල පොත් 117 ක වටිනාකම සාමාජිකයන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව පුස්තකාල පොත් සමීක්ෂණයේ දී රු.13,974 ක් වටිනා පොත් 80 ක් සමීක්ෂණ සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

---------------

**3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.34,151,894 ක් වැයකර ඉදිකර තිබූ බහු කාර්ය ගොඩනැගිල්ලේ විදුලි සෝපානයක් සවිකිරීම සඳහා රු.4,100,933 ක් වැයකර තිබුණි. මෙම විදුලි සෝපානය ආබාධිත පිවිසුමක් ලෙස භාවිතයට ගැනීමේ අරමුණ තිබුණ ද, ආබාධිත පුද්ගලයින් සඳහා භාවිතා කළහැකි ලෙස සවිකර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසාගෙන තිබුණු රු.134,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) එක් වැය විෂයක අනුමත වියදම් සීමාව ඉක්මවා රු.1,783,686 ක් වැයකර තිබුණු අතර, එම වටිනාකම සියයට 26 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.9,942,065 ක් වූ අතර, එම වටිනාකම සියයට 36 සිට සියයට 58 අතර පරාසයක විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන නඩත්තු කිරීම | | දීර්ඝ කාලයක් පවතින ශේෂ නිරවුල් නොකිරීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අවධානය යොමුකර නොතිබීම. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | වාහන පාලනය | | නිෂ්ක්‍රීය වාහන අපහරණය හෝ අළුත්වැඩියා නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රායෝගික තත්ත්වයන්ට ගැලපෙන පරිදි අයවැය ලේඛනය සංශෝධනය කර නොතිබීම. |